# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023

2025 අගෝස්තු

### මානවශාස්ත්‍ර පීඨය

## සාහිත්‍ය විචාරය (නව නිර්දේශය)

### සංස්කෘත සාහිත්‍ය විචාරයේ ප්‍රභවය, ඡන්දස් හා සිංහල විචාර සම්ප්‍රදාය

## LTCR 18224

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. සිංහල ඡන්දස් ශාස්ත්‍රය පිළිබඳ ප්‍රාමාණික විස්තරයක් සපයන්න.

02. එළු සදස් ලකුණු පිළිබඳ හඳුන්වා, කාව්‍යෝපදේශ ග්‍රන්ථයක් වශයෙන් එහි වැදගත්කම පහදන්න.

03. පහත සඳහන් ගී වීරිත්වලින් පහක ලක්ෂ්‍ය-ලක්ෂණ දක්වන්න.

    i. පියුම් ගී
    ii. මත්වල ගී
    iii. උමතු ගී
    iv. කව් ගී
    v. බමර ගී
    vi. යහ ගී
    vii. දුවග ගී
    viii. කාරිකා ගී
    ix. සසපුලුතු ගී
    x. සඳහට ගී

## II කොටස

04. රස නිෂ්පත්තිය පිළිබඳ න්‍යායාත්මක ව හඳුන්වා, නාට්‍ය වෙතින් රස ජනනය වන ආකාරය විභාග කරන්න.

05. සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍ය විචාරය සඳහා රසවාදය භාවිත කළ හැකි ආකාරය නිදර්ශනාශ්‍රයෙන් විග්‍රහ කරන්න.

06. නූතන කාව්‍ය විමර්ශනයේ දී රස සිද්ධාන්තය භාවිත කළ හැකි ද යන්න නිදසුන් මඟින් පහදන්න.

## III කොටස

07. අලංකාරවාදයේ ප්‍රභවය හා ව්‍යාප්තිය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

08. සියබස්ලකරේ අලංකාර සම්බන්ධයෙන් කෙරෙන විග්‍රහය අරභයා ඔබේ අදහස් දක්වන්න.

09. සිදත් සඟරාවේ ඉටු-අනිටු හා ලකර අදියර පිළිබඳ හැඳින්වීමක් කරන්න.

10. 'පෙරදිග විචාර සිද්ධාන්ත සිංහල කාව්‍ය සම්ප්‍රදාය මත ඇති කළ බලපෑම හඳුනාගැනීමෙහි ලා ගුත්තිල කාව්‍යය ප්‍රබල මූලාශ්‍රයකි.' විමසන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගින්)

*****************************